# 140අභ්‍යන්තර ලිපි INTERNAL MEMO

ශ්‍රී ලංකා විශ්‍රාම
Sri Lanka Pension

වෙතින් (From) : විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්   දිනය (Date): 2014- 09- 12

වෙතට (To) : සියළුම මාණ්ඩලික නිලධාරීන්   යොමුව (Reference): විවැ/ප්‍රති/කමිටු/2014

විෂය (Subject) : ප්‍රතිපත්ති කමිටු තීරණ දැනුම්දීම

2014-08-05 වෙනි අඟහරුවාදා දින පවත්වන ලද 2014 ප්‍රතිපත්ති කමිටු රැස්වීම අංක 05 හිදී ගනු ලැබූ තීරණ පහත සඳහන් වේ. ඉදිරියේදී මෙවැනිම ගැටළු ඉදිරිපත් වන අවස්ථාවේදී පහත ලබා දී ඇති තීරණ අනුව කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

| අංක | සාකච්ඡා කළ ගැටළු හා චක්‍රලේඛ | ඉදිරිපත් කල අංශය | ලබාදුන් තීරණය |
|---|---|---|---|
| ප්‍රති/14/05/ 01 | පෙර විවාහය නීත්‍යානුකූලව අවසන් කිරීම | වැන්දඹු අනත්දරු වි.වැ. අංශය W&OP/PC/ 14/04/ PRASHA | තෛසයි තීන්දුවේ දින සිට මාස 3 ක් ඇතුළත සිදුවන විවාහ සඳහා හිමිකම් ලබා නොදීම. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පදනම් කරගත තෛසයි තීන්දු දිනෙන් මාස තුනට පසුව ඊළඟ විවාහය සිදුවී නම් හා දික්කසාදය සනාථ කල හැකි ලියකියවිලි ඉදිරිපත් කර නැති වුවත් පළමු දික්කසාද තීන්දුව නිශ්ප්‍රභා වී හෝ වෙනත් තීන්දුවක් ලබා දී ඇති බවත් අනාවරණය නොවේ නම් දෙවන වැන්දඹුවට හිමිකම් ලබා දීම. මේ සඳහා නියමිත කාලසීමාවක් ලබා දී ඒ අනුව කාර්ය නිපකල යුතුය. තෛසයි තීන්දු ප්‍රකාශය විත්ති පාර්ශවයට භාර දී නොමැති බවට එම පාර්ශවය විසින් දැනුම් දෙන අවස්ථාවක ඇය වෙත කරුණු ඉදිරිපත් කර තීන්දුවක් ලබා දෙන තෙක් පවත්නා විධිවිධාන අනුව කටයුතු කිරීම. මේ පිළිබඳව කටයුතු කිරීමේදී අදාල පාර්ශවය වෙත මාස 03 ක කාලයක් ලබා දී ඉදිරිපත් නොකලේ නම් අනෙක් පාර්ශවයට ගෙවන බව ලිඛිතව දැන්වීම. මාස තුනක කාලයක් තුළ අවම වශයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් සඳහා ප්‍රවේශ වූ බව සනාථ කල යුතුය. |
| ප්‍රති/14/05/ 02. | අනියම් සම්බන්ධතා මත වැන්දඹු අනත්දරු වැටුප අහිමිවීම | වැන්දඹු අනත්දරු වි.වැ. අංශය W&OP/PC/ 14/05/ PRASHA | අනත්දරුවන් සිටින අවස්ථාවකදී වැන්දඹු විශ්‍රාම වැටුප නතර කිරීම නිසා එම දරුවන්ගේ පෝෂණය, අධ්‍යාපනය හා අනෙකුත් අවශ්‍යතා සපුරා ගත නොහැකි වන බැවින් නිශ්චිතව අවසන් තීරණයකට එළඹෙන තෙක් අඛණ්ඩව විශ්‍රාම වැටුප ගෙවීමට තීරණය කිරීම හා අනත්දරුවන් සිටී නම් ඒ අයට පෝෂණය හා ආරක්ෂණය සැපයීමට හැකි වන පරිදි වැන්දඹුවට හෝ වෙනත් අපයකුට අත්හිටුවීමකින් තොරව ගෙවීම් කටයුතු කිරීමට උපදෙස් දීම.<br>ළමා හිමිකම් නිලධාරීන්, වනිතා සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් හා මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් විධිමත් පරීක්ෂණයක් පවත්වා මාස දෙකක් තුල නිර්දේශයන් ලබා දීමට උපදෙස් දීම. මෙම පරීක්ෂණය විධිමත් හා රහසිගත විය යුතු අතර අදාල නිර්දේශ පදනම් කරගනිමින් අවශ්‍ය අවස්ථාවල ගෙවීම් අත්හිටුවීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | | එමෙන්ම දායකයාගේ නීත්‍යානුකූල නොවන විවාහයකින් උපන් දරුවන් වෙත පිතෘත්වය උප්පැන්න සහතිකය මගින් සනාථ වන අවස්ථාවලදී එම දරුවන්ටද දායකයාගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් යම් ප්‍රතිශතයක් ගෙවීමට හැකි වන පරිදි පනතේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම සඳහා කෙටුම්පතක් සකස් කර ඉදිරිපත් කිරීමට උපදෙස් දීම. එනෙක් අතුරු ක්‍රියාමාර්ගයක් ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කිරීමට උපදෙස් දීම.<br>දායිකාවගේ ඇවැමෙන් නීත්‍යානුකූල විවාහයෙන් තොරව හෝ විවාහ සහතිකයක් ඉදිරිපත් නොකරන අවස්ථාවකදී දරුවෙකු බිහිවී ඇති විට මාතෘත්වය නෛසර්ගිකව ලැබෙන්නක් බැවින් එම දායිකාවගේ දරුවන්ට සම්පූර්ණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපක් ගෙවීමට අනුමැතිය ලබා දීම |
| ප්‍රති/14/05/03 | දික්කසාදයට අදාල ලියවිලි ඉදිරිපත් කිරීම. | වැන්දඹු අනත්දරු වි.වැ. අංශය W&OP/PC/14/06/PRASHA | විවාහ සහතිකය වලංගු හා පිළිගත හැකිනම් හා වෙනත් සිද්ධීන් වාර්තා නොවේ නම් විවාහ සහතිකය පිළිගෙන ඊට අදාළ හිමිකරුවන් වෙත හිමිකම් ලබා දීමට උපදෙස් ලබා දීම. මෙහිදී තහවුරු කිරීමට ඉදිරිපත් කරනු ලබන අනෙකුත් ලේඛන සමග දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම.<br>යම් හෙයකින් පසු අවස්ථාවකදී නියම හිමිකරු ලෙස පළමු කලත්‍රයා ඉදිරිපත් වී නීත්‍යානුකූල හිමිකාරිත්වය සනාථ කරයි නම් මුල් ගෙවීම අත්හිටුවා එදින සිට අදාළ පරිදි නීත්‍යානුකූල හිමිකරු වෙත ගෙවීම කිරීම හා නීත්‍යානුකූල හිමිකරුට ගෙවීමට හැකිවන පරිදි අදාළ මුදල් ආපසු ලබා දීම සඳහා පෙර හිමිකම ලබා ගත් අය වෙත දැනුම් දීම. එලෙස කටයුතු කිරීම එම පාර්ශවය පැහැර හරින අවස්ථාවකදී නම් හිමිකම ලබා ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීත්‍යානුකූල හිමිකරු වෙත දැනුම් දීම.<br>අදාල පාර්ශවකරුවන් විසින් මෙම ගැටළුව විසඳා ගැනී[illegible] හා තවදුරටත් මේ සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් මැදිහත් නොවන බව දැන්වීම. |
| ප්‍රති/14/05/04 | වැඩිපුර ගෙවීම සඳහා 25% ක දඩ අය කිරීම | වැන්දඹු අනත්දරු වි.වැ. අංශය W&OP/PC/14/07/PRASHA | 10% දඩ මුදලක් අයකිරීමට කටයුතු කිරීම. ඉදිරියේදී නිකුත් කරනු ලබන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයන්හි තුන්වන ඡේදය අවසානයේ පහත සඳහන් වගන්තිය ඇතුලත් කළ යුතුය.<br>"එලෙස විවාහ වීම නොදැන්වීම හේතුවෙන් වැඩිපුර ලබා ගන්නා විශ්‍රාම වැටුප් ආපසු ගෙවිය යුතු අතර 10% ක දඩයක්ද අය කරනු ලැබේ." |
| ප්‍රති/14/05/05 | ආබාධිත විශ්‍රාම වැටුප ගෙවීම | වැන්දඹු අනත්දරු වි.වැ. අංශය W&OP/PC/14/08/ABA. | වෙබ් අඩවියේ තොරතුරු ඇතුලත් කිරීම හා යාවත්කාලීන කිරීම.<br>සමාජ සේවා අමාත්‍යාංශය සමග සම්බන්ධ වී ප්‍රජා පාදිත පුනරුත්ථාපන වැඩසටහන (Community Based Rehabilitee) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. අදාල පාර්ශව සාකච්ඡාවට කැඳවීම හා එහිදී තීරණ වලට එළඹීම. |

| | | | |
|---|---|---|---|
| ප්‍රති/14/05/06 | උපතේ සිට ආබාධිත තැනැත්තන් වෙත ආබාධිත විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමේ දිනය තීරණය කිරීම. | වැන්දඹු අනත්දරු වි.වැ. අංශය W&OP/PC/14/09/ABA | වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කොට එම නිර්දේශය අනුව කටයුතු කිරීම. වෛද්‍ය මණ්ඩල නිර්දේශිත දිනය පදනම් කොට ගෙන ගෙවීම් කටයුතු සිදු කිරීම. |
| ප්‍රති/14/05/07 | උපතේදී ආබාධිත නොවන විට වසර 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමු කළ යුතු වීම. | වැන්දඹු අනත්දරු වි.වැ. අංශය W&OP/PC/14/10/ABA | පෙර වෛද්‍ය මණ්ඩල නිර්දේශිත දිනයේ සිට වසර 4 ½ සම්පූර්ණ වන විට වෛද්‍ය මණ්ඩලයට යොමු කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම. එලෙස නියමිත පරිදි වෛද්‍ය මණ්ඩල වෙත යොමු නොකරන ලදුව මියයාම් හෝ පදිංචිය වෙනස් කිරීම වැනි හේතුන් මත භාරකරු වෙනස් කිරීම හෝ ප්‍රතිසංශෝධනය වැනි කාරණා සඳහා යොමු කරන අවස්ථාවන් වලදී එම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට පියවර ගැනීම. දෙවන වෛද්‍ය මණ්ඩල නිර්දේශය ලැබෙන තෙක් අඛණ්ඩව වැටුප් ගෙවීම. ඒ අතරතුර වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමෙන් ලැබෙන වෛද්‍ය මණ්ඩල නිර්දේශය මත ගෙවීම් අත්හිටුවීමට හෝ තවදුරටත් ගෙවීමට කටයුතු කිරීම. පසුව යොමු කරන වෛද්‍ය මණ්ඩල සඳහා මුල් වෛද්‍ය මණ්ඩල නිර්දේශ පිළිබඳව දැනුවත් කිරීම. මුල් වෛද්‍ය මණ්ඩල මගින් තහවුරු වූ ආබාධිත තත්වය තවදුරටත් පවතීද යන්න නිශ්චය කර ගැනීම සඳහා පමණක් දෙවන හෝ තෙවන වෛද්‍ය මණ්ඩල නිර්දේශ අදාල කර ගැනීම. සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් සමග සාකච්ඡා කර සුදුසු පරිදි චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කිරීම. |
| ප්‍රති/14/05/08 | උපතේදී හෝ අනත්දරු වයස් සීමාවේදී ආබාධිත තත්වයට පත් වූ බව තහවුරු මත වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම. | වැන්දඹු අනත්දරු අංශය W&OP/PC/14/11/ABA | සෞඛ්‍ය අමාත්‍යාංශය සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව ඉදිරි කටයුතු තීරණය කිරීම. |
| ප්‍රති/14/05/09 | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛණය යටතේ ගෙවීම්කිරීමේදී සම්බන්ධීකරණ නිළධාරීලෙස සේවය කළ සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය සඳහා අදාල කර ගැනීම. | ව්‍යාපෘති හා සංවර්ධන අංශය | 1989 අදාල ගැසට් නිවේදනය මගින් සම්බන්ධීකරණ ලේකම් තනතුර පිළිගෙන ඇති බැවින් හා "ට" උපලේඛණයට අදාල 06/2011 චක්‍රලේඛය මගින් එම විධිවිධාන අවලංගුකර නොමැති බැවින් අදාල තනතුරෙහි සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය සඳහා අදාල කර ගැනීමට අනුමැතිය ලබා දීම. |

ජ. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ (ජගත් ඩී. ඩයස්

අත්. කළේ / එස්.එස්. හෙට්ටිආරච්චි